ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2024/2025
අවසාන පරීක්ෂණය - 2025
**SNP8247/SNP8237-** පුනරුත්ථාපනය සහ ප්‍රජා මූලික පුනරුත්ථාපනය
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2025.07.26 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (3) පිළිතුරු සපයන්න.**

## <u>1 වන කොටස</u>

1. 1980 ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) වර්ගීකරණයට අනුව ඌනතාවය, දුබලතාවය සහ බාධිතබව යන පද නිවැරදිව නිර්වචනය කරන්න.

2. දුබලතාවය පිළිබඳ සමාජ ආකෘතියේ (Social Model of Disability) දක්නට ලැබෙන ලක්ෂණ පහක් (05) සඳහන් කර, මෙම ලක්ෂණවලින් එකක් අන්තර්කරණ සන්දර්භය තුළ භාවිතය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

3. දුබලතාවය සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් 2003 ශ්‍රී ලංකාවේ ජාතික දුබලතා ප්‍රතිපත්තියේ දැක්වෙන ප්‍රධාන අංග පහක් (05) ලැයිස්තුගත කරන්න.

4. ශ්‍රවන ඌනතා සහිත දරුවෙකුට පාසලේදී මුහුණ දීමට සිදුවියහැකි අභියෝග පිළිබඳව ප්‍රායෝගික උදාහරණ තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

5. ක්‍රියාකාරිත්වය,දුබලතාව සහ සෞඛ්‍යය පිළිබඳ ජාත්‍යන්තර වර්ගීකරණය (ICIDH) මඟින් වර්ගීකරණය කර ඇති දුබලතා කාණ්ඩ හතරක් (04) ලැයිස්තුගත කරන්න.

6. ප්‍රජා මූලික පුනරුත්ථාපනයේ (Community-Based Rehabilitation - CBR) ප්‍රධාන අරමුණු පහක් (05) නම් කරන්න.

7. 1948 මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ මූලධර්ම අනුගමනය කරමින් ස්ථාපිත කර ඇති ජාත්‍යාන්තර සම්මුතීන් පහක් (05) සඳහන් කරන්න.

8. ප්‍රජා මූලික පුනරුත්ථාපනය (CBR) වැඩසටහනක් තුළ දුබලතා සහිත පුද්ගලයන් සවිබල ගැන්වීම සඳහා භාවිත කරන උපාය මාර්ග තුනක් (03) නම් කරන්න.

(ලකුණු 05x08 = ලකුණු 40)

## 2 වන කොටස

9. (i) ප්‍රජා සහභාගීත්වය නිර්වචනය කර ප්‍රජා මූලික පුනරුත්තාපනයේ (CBR) සාර්ථකත්වය සඳහා එහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) දුබලතා සහිත දරුවන්ට සහය වීමේදී, ගමේ පුනරුත්තාපන කමිටුවක කාර්යභාරය උදාහරණ දෙකක් (02) සපයමින් විස්තර කරන්න. (ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ වල දුබලතා සහිත දරුවන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේදී, පාසල් ප්‍රජාවේ හවුල්කාරිත්වයේ වැදගත්කම තක්සේරු කරන්න. (ලකුණු 10)

10. (i) දුබලතා සහිත දරුවෙකු පුනරුත්ථාපනය කිරීමේ ක්‍රියාවලියේදී පවුලේ වගකීම් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) නිවසේදී මෙම දරුවන්ගේ ස්වාධීන ජීවන කුසලතා සංවර්ධනය කිරීමට දෙමාපියන්ට සහාය විය හැකි ක්‍රම තුනක් (03) සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) ක්‍රියාකාරී පවුල් සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා නිවාස-පාසල් අතර හවුල්කාරිත්වයන් ශක්තිමත් කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

11. (i) පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා, ඵලදායී ප්‍රජා සහභාගීත්වයේ ප්‍රධාන ලක්ෂණ සඳහන් කරන්න. (ලකුණු 05)

(ii) ගුරුවරුන්ට පාසල් තුළ අන්තර්කරණ පිළිවෙත් (inclusive practices) සඳහා සහාය වීමට දේශීය ප්‍රජාව සම්බන්ධ කර ගත හැකි ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 07)

(iii) ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපනය සඳහා ප්‍රජා සහභාගීත්වයේ ඇති බාධක විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න. (ලකුණු 08)

12. (i) උත්තාපනය සහ පුනරුත්ථාපනය යන පද සඳහා ප්‍රායෝගික උදාහරණ දෙකක් (02) ලබාදෙමින් සංසන්දනය කරන්න. (ලකුණු 05)

(ii) ශාරීරික හෝ ප්‍රජානන ඌනතා සහිත සිසුන් අතර ක්‍රියාකාරී ස්වාධීනත්වය ප්‍රවර්ධනය කරන පාසල් පාදක මැදිහත්වීම් තුනක් (03) හඳුනාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) දුබලතා සහිත දරුවන් කෙරෙහි සමාජීය වශයෙන් සෘණාත්මක ආකල්ප ආමන්ත්‍රණය කිරීම සඳහා පාසලකට ක්‍රියාත්මක කළ හැකි උපාය මාර්ග හතරක් (04) සාකච්ඡා කරන්න. (ලකුණු 08)

13. (i) දුබලතා සහිත පුද්ගලයින්ගේ සංවිධානයක් (DPO) යනු කුමක්ද?
එය ප්‍රජා අන්තර්කරණ සඳහා දායක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ඵලදායී ස්ව සහයක කණ්ඩායම් (SHG) වල ලක්ෂණ දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 05)

(iii) දුබලතා සහිත පුද්ගලයින් සඳහා දේශපාලන සහභාගීත්වයේ දිගුකාලීන ප්‍රතිඵල දෙකක් (02) ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10)

14. (i) 1973 එක්සත් ජනපදයේ පුනරුත්ථාපන පනතේ 504 වගන්තියේ ඇතුලත් තීරණාත්මක විධිවිධාන තුනක් (03) සාරාංශ කරන්න. (ලකුණු 05)

(ii) දුබලතා සහිත සිසුන්ගේ අධ්‍යාපන සංක්‍රාන්ති සඳහා සහාය වීමේදී, පාසල් පරිපාලනයේ භූමිකාව සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii) දුබලතා සහිත සිසුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය සැලසුම් කිරීමේදී සහ අන්තර්කරණ අධ්‍යාපනය ලබාදීමේදී සාමාන්‍ය පන්ති කාමර ගුරුවරයාගේ කාර්යභාරය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 08)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*